නදී තරණය

සුබදා සේන් ගුප්ත නමැති භාරතීය ලේඛිකාව විසින් ඓතිහාසික තේමාවන් යටතේ ලියන ලද කථා රාශියකි. සත්‍ය සිදුවීම්, චරිත හා වැදගත් පුද්ගලයින් සම්බන්ධකොට ලියන ලද මේ කතා රසවත්ය. මේ ඇය ලියූ Crossing the River නමැති කථාවේ සංක්ෂිප්ත අනුවාදයයි.

චසන්තයේ හිමිදිරි පාන්දරක මහළු තොටියා සුපුරුදු පරිදි ගංගා නම් ගඟේ කශී තොටුපළට පැමිණ ඔරුව දියත්කොට හරහට දැමූ හබලට හේත්තුවී නදිය දෙස බලා සිටියේ ය.

තොටියාගේ ඇස් ඇදී ගියේ ගං කණ්ඩිය උඩට පැමිණි තරුණ ශ්‍රමණයාගේ හිරුරැස් වැටී බබලන කහසිවුර වෙතය. මෙවැනි සාධුවරුන් රාශියක් දිනපතා දකින තොටියා එවැන්නන් ඔරුව වෙතට එනු නුරුස්සයි. ඒ බොහෝ විට ඔවුන් තඹ දොයිතුවක් නැති සිහන්නන් නිසා ය. කහ වස්ත්‍රයට ගරුකර පිනට ගඟෙන් එගොඩ කරවා ගැන්මට ඔව්හු අපේක්ෂා කරති. තොටියා දුප්පතෙකි. පවුල් බර ඇත්තෙකි. ඔවුන්ගේ ආශීර්වාදයෙන් ඔහුට වැඩක් නැත.

තොටියාගේ ඔරුව දුටු ශ්‍රමණයා ඉක්මනින් පඩි බැස ඔරුව ළඟට පැමිණියේ ය.

“ ඔබේ ඔරුව නිදහස්ද.....? ” ශ්‍රමණයා ඇසී ය.

“ ඔව්! ඔරු කුළිය ගෙවන්න පුළුවන් අයට පමණක් ”

“ එසේ කීම හරි..... ඇත්තටම මා ළඟ ගෙවන්න මුදල් නැහැ.....”

එසේ කී ශ්‍රමණ තෙමේ ගං ඉවුරේ පඩිය මත හරිබරි ගැසී ඉඳගත්තේය. සිය රෙදි පොදිය සහ ලී පාත්‍රයද ලංකර ගත් තේය. නදී තරණයට කිසිම කළබල බවක් නොපෙනිණ.

“ තරුණ ශ්‍රමණය ඔබට ඉවසා සිටින්නට පුළුවන් නම් මට ලැබෙන කුලියක් කරන විට ඔබද ගෙන යන්නම්....” තොටියා කීය. “ ඔබට යන්නට ඕනෑ කොහාටද ...? ”

“ මේ ගඟේ ඉහළට..... ඉසිපතන කියන තැනට..... එහි මිග උයනක් තිබෙනවා..... එහිදී මගේ පරණ මිතුරන් කීප දෙනෙකු මුණගැසෙන්නට බලාපොරොත්තු වෙනවා.....”

“ ඉසිපතන...? ඒ මිග වනය සාධුවරුන්ගෙන් පිරිලා. ඔබගේ මිතුරන් එහි භාවනාකරනවා වෙන්න ඇති....”

“ ඔව්..” යයි තෙපලූ ශ්‍රමණ තෙමේ ගඟ දෙස බලා සිටියේ ය.

ඔහුගේ මුහුණ නිරීක්ෂණය කළ තොටියාට මේ පුද්ගලයා ගැටවරයෙකු නොවන බව පෙනිණ. වයස තිස් පහක් පමණ පෙනුණ ඔහුගේ පැදුණු හකු සහ ඇදී ගිය මුහුණ මෑතදී නිරහාරව සිටීම වැනි දුක් විඳි බවක් පෙන්නුම් කළේ ය. එහෙත් ඔහුගේ උත්තෑංග දේහ විලාශය හා අධිෂ්ඨානාත්මක බැල්මද ඔහු උසස් පවුලක අයෙකු බවද දැනවී ය. සුමට දෑත් සහ දිගු ඇඟිලිද දූවිල්ලෙන් වැසීගිය නමුත් දෙපා ද සැප පහසු විඳි ජීවිතයක් පිළිබිඹු කළේ ය. .සැපට හැදුණු මේ භාදයාට දානයක්වත් හිඟාගන්න පුළුවන්ද දන්නෙ නැහැ. යි යන අදහස තොටියාගේ සිතට නැගිණ.

, මිතුර, ඔබ හැමදාම ගංගානම් ගඟේ හිරු උදාවන සැටි දකිනවා. ඔබ නම් හරි වාසනාවන්තයෙක්. , ශ්‍රමණයා කීය. , ගලන ගංගාවක් නිකම් ජලධාරාවකට වඩා ජීවිතයට යම් අරමුණක් බලාපොරොත්තුවක් සපයනවා. මේ ගංගාවේ උතුම් අර්ථය මට වඩා ඔබට මනාව තේරෙනවා ඇති.,

ඒ කියූ දේ තොටියාට නොතේරිණි. ඒ ගැන ප්‍රශ්නඅසන්නට ප්‍රශ්න කරන්නට පෙර තොටියාගේ සුපුරුදු මගියෙක් ඔරුව වෙත එනු පෙනිණ. තමා ගඟ පහළට යන බව ශ්‍රමණයාට කියූ තොටියා මගියා ගොඩවූ විගස ගමන ඇරඹී ය.

මගීන් කීප දෙනෙකු එසේ එගොඩ මෙගොඩ ගෙනගිය තොටියා ආපසු තොටුපළට ළංවත්ම දුටුවේ තවමත් සිනාමුසු මුහුණින් බලා සිටින ශ්‍රමණයාය. ඔහු ඉදිරියට බැස විත් ඔරුව ඉවුරේ ගැටිය වෙතට ළංකර ගන්නට තොටියාට උදව් විය.

උපයා ඇති කාසි ගණන් කර බැලූ තොටියා ඉන් පසු ශ්‍රමණයන් දෙසට හැරී, “ නගින්න ඔරුවට මං ඔබ ගං ඉහළ ඉසිපතනයට ගෙන යන්නම් ” යයි තෙපළේය.

“ සොහොයුර ඔබ ඉතා කරුණා වන්තයි.....” ශ්‍රමණ තෙමේ ඔරුවට නගින ගමන් තෙපළේය.

ඔරුව ගඟ දිගේ උඩට මඳ දුරක් ගිය පසු තොටියා මෙසේ ඇසීය. “ තරුණ ශ්‍රමණය.... ඔබේ මුල් ගම කොහේද....?

ඉන් මඳක් තිගැස්සුණු ශ්‍රමණ තෙමේ ඔහුගේ ජීවිත කතාව තොටියාට කියන්නට පටන් ගත්තේ ය. තමා රජ පවුලක කෙනෙකු බවද, විවාහ වී බිරිඳ දරුවෙකු ද ලැබූ පසු ඒ සියල්ල අත්හැරදමා වනගතව සත්‍යය සොයා අවුරුදු ගණනාවක් ගත කළ බව ද, ශරීරයට දැඩි දුක් දුන් සැටි ද විස්තර කළේ ය.

“ ඔබලා වැනි සාධුවරු විමුක්තිය සොයා යන ගමන මහා ආත් මාර්ථකාමී ක්‍රියාවක්. එයට පවුලේ අය වන්දි ගෙවනවා. ඔබට කවදා හරි ආත්ම ශක්තියක් ඇති වුනොත් ආපසු ගෙදර ගිහින් පියා, භාර්යාව හා පුතණුවන් හමුවී ඔබ ගිය ගමන වටිනවාදැයි ඒ අය සිතනවාදැයි විමසනු හොඳා.....”

ඒ අසා ශ්‍රමණයෝ තොටියාට මෙසේ කීහ.

“ සොයුර, ඔබට මේ සියල්ල දැනෙන ආකාරය මට තේරෙනවා. නමුත් අප මේ ලොවට එන්නේ යම් පරමාර්ථ යකට. මා කුමක් කළ යුතුද යන්න මට පැහැදිලි අවබෝධයක් තිබුණා. ප්‍රශ්න වලට මා සොයාගත් විසඳුම් මගේ පවුලේ අයට පමණක් නො-වෙයි, මිනිසුන් විශාල ගණනකට උදව් වේවි.....”

“ මොන විසඳුම් ද? ඔබ දෙවියන් සොයාගත්තා ද....? ”

“ මා දෙවියන් සෙවිවේ නැහැ.....”

“ ආ එහෙනම් ඒක අළුත් එකක්.....”

තොටියා සිනාවක් පළකරමින් කීවේ ය. “ ඇත්තටම ඔබ සොයාගත්තේ මොකක්ද ....? ”

“ අප වටා ඇති ලෝකය දිහා බලන්න..... රෝගීවීම, වයස්ගතවීම, මරණය ආදී වේදනාකාරී දේවල්..... මේ දුක්ඛයන්ට මුහුණ දීමට.... ඒ අහිබවා ගොස් ජීවිතය අර්ථවත් කර ගැන්මට මා මාර්ගයක් සොයා ගත්තා.....”

“ ඔබ වගේම මමත් ජීවිතය ගැන හිතනවා. හැමදාම මේ ඔරුව පදින කොට මට නිරන්තරයෙන් පේන්නෙ මේ ගඟ. ලෝකයේ සැප මෙන්ම දුක් ද මේ ගංගාව රැගෙන යන හැටි මට පේනවා. පුද කළ මල්, පත්තු කළ පහන්, පූජා වට්ටි, මළමිණී මේ හැම එකක්ම ප්‍රතික්ෂෙප නොකර මේ ගඟ බාරගෙන ගලාගෙන යනවා. මාත් ඒ වගේ දුක් කරදර වේදනා ඔහේ මා මතින් ගලායන්න අරිනවා. ඒවයින් කම්පාවන්නේ නැහැ.....”

“ බොහොම අගෙයි..... ඒ තමා නදී තරණය.....ඔබ විසින්ම විසඳුම සො-යාගෙන තියෙනවා....නමුත් බොහෝ අයට එය අවබෝධ කරගන්ට බැහැ....”

“ ඒ අයට සත්‍යය පෙන්වා දෙන්ට ඔබ අදහස් කරනවා නේද? ඒක බොහො ම අගේ ඇති දෙයක්....” එසේ කියද්දී වයස්ගත තොටියාගේ මුහුණෙහි කරුණාභරිත පෙනුමක් විය.

“ ඔබට ස්තුතියි ....” ශ්‍රමණයෝ කීහ. “ඔබ සමග කතාකිරීමෙන් මා අවබෝධකරගත් සත්‍යයට සජීවී බවක් ආරෝපණය කරගන්නට මට හැකි වුණා. අද මම ඉසිපතනයට යන්නේ මගේ ප්‍රථම දේශනාව මගේ සගයන්ට පවත්වන්නයි. දුකෙන් යම් අයෙක් ගලවාගන්නා හැම විටකම මට ඔබ මතක්වෙනවා ඇති...”

♦ **වකුල ගුණපාල**
Ilford Essex UK

උවදුරු සතුරු යළි මතුවී එන දාට රණවිරු නොමැති දුක අපි කියමුද කාට?

මේ අදහස් ටික ඉක්මනින් දවසක ලියන්න සිද්ධ වේවිය කියලා මට හිතුණේ 2009 යුද්ධෙ ඉවරවෙලා මාස දෙකකට විතර පස්සෙ. අපේ රටේ හුඟ දෙනෙකුට පහුවුණු අවුරුදු 30 ක් පුරා වුණු දේවල් ඉක්මනට මතක නැතිවේගන යනවා. සමහරුන්ට මතකයක් ඇත්තෙම නෑ. 2009 වෙන කල් සිංහළ අවුරුදු, වෙසක්, පොසොන්, ඒ කාල ගෙවුණු හැටි මතකද? අවුරුද්දට නෑගමන් ගියේ නැහැ. අවැරුදු උත්සව කෙළි සෙල්ලම් පැවැත්වුණේ නැහැ. වෙසක් එකට තොරණ් ගැහුවෙ නැහැ. රෑට වෙසක් බලන්න ගියේ නැහැ. හැන්දෑවට පන්සල් ගියේ නැහැ. වෙසක් දවසෙත් ඉක්මනට පන්සලට ගිහිං හැන්දෑ වෙන්න ඉස්සෙල්ලා හමුදාවෙ රාජකාරිවල යෙදෙන අය හැර අනික් සේරම ගෙවල් වල. උදේට තමයි ගෙයින් එළියට බහින්නෙ. ඒකත් හොඳට වටපිට බලලා. චිත්‍රපටි බලන්න මිනිස්සු යන්නෙ නැහැ. සිනමාහල් ඒ කාලෙ වේලෙනවා. 630 930 ෂෝ ඇත්තෙම නෑ. නාට්‍යකලාවත් එහෙමයි. මොන පික්චර් ද? නාට්‍යයද? බහුතරයක් හිටියෙ ඇඩූ කඳුලෙන්. හවසට වැඩ ඇරුණු ගමන් ගෙදර දුවගෙන එනවා අහුවෙච්ච බස් එකක නැගලා. ඒකාලේ පොල් පටවලා වගේ හවස බස්වල. පුළුවන් ඉක්මනින් ගෙදර යන්න තදියම. ලංකාවෙ කවුරුත් එදා එහෙමයි. ඊට අමතරව කොහේ හරි ගමක, වැඩියත්ම සිංහළ ගම්වල, හැමදාම මරණයක්. එක්කො හමුදා මරණයක්. නැත්නම් ත්‍රස්ත ප්‍රහාරයකින් වුණු විපතක්.

මේලියන විස්තර මට කොහෙන්ද? මේ සේරම ලංකාවෙ අපේ යාලු මිත්‍රයො, නෑදෑයො, අපේ පවුල්වල උදවිය පහුගිය කාලවල එවපු ලියුම් වල තිබුණු දේවල්. මගේ ලඟ ලොකු ලියුම් බන්ඩිල් එකක් තියනවා. මම ඒ ලියුම් සුරක්ෂිතව අරං තියලා තියනවා ඒකාලෙ පත්තර වලින් කපා ගත්තු විස්තරත් එක්ක. ඒවා යුගයක මතක සටහන්.

එච්චර නෙවෙයි, මිනිස්සු හැසිරෙන්නෙ දැන් ඔක්කොම හරි වගේ. දැන් කොළඹ සැණකෙළි වෙස් අරගන. අර විසාලා මහනුවර තුන් බිය එන්න ඉස්සෙල්ලා තිබුණු සැණකෙළි වාතාවරණෙ වගේ. මහ රැටත් කොළඹ පාරවල් වල කාර් රේස් යනවා. ඒ අහළ පහළ මිනිස්සුන්ට නින්දක් නෑ. රජයේ ලොකු ලොක්කන්ගෙ තරුණ ළමයින්ගෙ වැඩ. කාටද පැමිණිලි කරන්නෙ. නඩුත් හාමුදුරුවන්ගෙ බඩුත් හාමුදුරුවන්ගෙ.

ඒවා පැත්තකට දාමු. යුද්දෙ ඉවරවුනු බව ඇත්ත. ඒත් ලංකාව ඒ අනතුරුදායක තත්වෙන් තවම මිදිලා නැහැ. කලින්ට වඩා දැන් ලංකාවට හතුරො වැඩිවෙලා බව හොඳට පේනවා. රට ඇතුළත හතුරො එකතුවෙනවා රටෙන් එළියෙ ඉන්න හතුරොත් එකතු වෙනවා. ලංකාවෙ ජනයා සැණකෙළි පවත්වද්දි විරුද්ධවාදීන් පෙරටත් වඩා සංවිධාන වෙනවා. පිනීවා වලදි මාර්තු මාසෙ වුණු දේ අපි කවුරුත් දැක්කා. දැන් ඒ ලෙඩේම ආයිත් ඔක්තෝබර් වල ගේන්න හදනවා. ජාත්‍යන්තර වශයෙන් ලංකාවෙ හුස්ම හිරකරන්නයි හදන්නෙ. ඒක අපි තේරුම්ගන්න ඕන. මේ භයානක තත්වය අපේ රජයවත් ජනතාව වත් තේරුම් අරගෙන නැහැ.

රටේ නායකයො මැති ඇමතිවරු ඇතුලු බොහොමයක් නගරබද ජනතාව හිතාගෙන ඉන්නෙ රට ආරක්ෂාකිරීම සහ බේරගැනීම අයිති හමුදාවෙ අයටය අපිට තියෙන්නෙ පුළුවන් තරම් සැප පහසුවට ජීවිතේ ගෙනියන්නය කියලා. ඒනිසා යුද්ධයක් තිබුණු බවත් දැන් ඒ කාටත් අමතක වෙලා. අවුරුදු 30 ක යුද්ධෙ දිනුවෙ කොයිතරම් අමාරුවෙන්ද කියලා දන්නෙ හමුදාවෙ හිටපු අය. උණ්ඩ වලට මුහුණු දුන් අය. ආබාධිත වුණු අය. රණවිරුවො දහස් ගණනක් ජීවිත පූජා කළා ඒ යුද්ධෙ දිනන්න. ශ්‍රීලංකාව මකර කටෙන් ගොඩ ආවා. ඒ සියළුම ගෞරවය හිමිවිය යුත්තේ රණවිරුවන්ට. ඔවුන් එදා රට වෙනුවෙන් ජීවිත පූජා නොකළා නම් අපට කතාකරන්න නිදහසක් ඉතුරුවෙන්නෙ නෑ. අන්න එය මතක තබාගත යුතුයි.

තවත් කිව යුතු දෙයක් තියනවා. වෙච්ච දෙයක් නැවතත් සිදු නොවේය කියලා හිතන්න අමාරුයි. ඒ දේවල් ඒ විදියටම නූනත් වෙන ආකාරයකින් වෙන්න පුළුවන්. යම් මතු දිනක අපේ රට විපතට වැටුණොත් එදාට දිවිපුදන්න අර දිවි දුන් විරුවො වගේ තව විරුවො හොයාගන්න වේවි. කොහෙන්ද හොයාගන්නෙ? කියන එක ප්‍රශ්නයක් වේවි. ඒ නිසා රට විපතට නොදා දැන් සිටම ආරක්ෂාකර ගැන්ම කාගේත් වගකීමයි. .

♦ **වෙලේගෙදර රාළ London**

කුරිරු තුස්තවාදී යුද්ධය නිමාකොට තෙවසරක් පිරීම නිමිත්තෙන් රණවිරු ප්‍රණාම පූජාව

බර්මිංහැම් හි ජේතවන විහාරයේදී

මැයි 19 වනදා රාත්‍රී 7.00 ට

තම මාතෘ භූමිය වෙනුවෙන් ඔව්හු දහඩියද කඳුළුද රුධිරයද අවසන ජීවිතයද පුද කළහ. ඒ උතුම් විරුවන් සිහිකර ඔවුන් වෙනුවෙන් මැයි 19 වෙනි දින සවස ඔබ නිවසේ පහනක් දල්වන්න !